# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2209/47 - 2021 ජනවාරි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

**ජනාධිපති විධානය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන හිතකාමී ලෙස පවත්නා නීති රෙගුලාසි සරල කිරීම පිළිබඳ කොමිෂන් සභාව ස්ථාපනය කිරීම.

1. ලලිත් වීරතුංග මැතිතුමා
   ජනාධිපති ප්‍රධාන උපදේශක
2. එස්.ඩී.ඒ.බී. බොරලැස්ස මැතිතුමා
   ලේකම්, ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
3. එම්.එම්.සී. ප්‍රදීනාන්දු මැතිතුමා
   විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්, විදුලිබල අංශය
4. ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා
   සභාපති, ජෝන් කීල්ස් සමූහය
5. සුරේෂ් ද මැල් මැතිතුමා
   සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලය
6. ජේ.සී. වැලිගමගේ මෙනවිය
   අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
7. චන්දන කුමාරසිංහ මැතිතුමා
   ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
8. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මැතිතුමා
9. ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මැතිතුමා

1A - G 33347 — 380 (2021/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

10. තිෂාන් සුබසිංහ මැතිතුමා
    ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී
11. රංජිත් ගුණතිලක මැතිතුමා
    ප්‍රධාන විධායක නිලධාරී, සන්කෙන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාගම
12. රේණුකා වීරකෝන් මහත්මිය
    විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
13. ජෙරාඩ් ඔන්ඩච්චි මැතිතුමා
    අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
14. අර්ජුන් ප්‍රනාන්දු මැතිතුමා
    අධ්‍යක්ෂ - විධායක නොවන, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
15. එස්.පී. ලියනආරච්චි මැතිතුමා
    සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් අංශය
16. ඇන්ස්ලම් පෙරේරා මැතිතුමා
    කළමනාකාර අධ්‍යක්ෂ, මෙල්ස්නා තේ
17. නිශ්ශංක විජේරත්න මැතිතුමා
    මහලේකම් / ප්‍රධාන විධායක නිලධාරී, කර්මාන්ත මණ්ඩලය
18. චන්ද්‍රා වික්‍රමසිංහ මැතිතුමා
    සභාපති / අධ්‍යක්ෂ ජනරාල්, තීම් රිසෝර්ට්ස් ඇන්ඩ් ස්පාස්

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

සංකීර්ණවූත්, දීර්ඝවූත්, අනුමැතීන්, අවසර දීම් හා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටි හා ක්‍රමවේදයන් සමස්ත සංවර්ධන ක්‍රියාවලියන් කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලබන බව සැලකිල්ලට ගනිමින් ද,

මෙම විවිධාකාරවූත්, දීර්ඝවූත්, නියාමන ක්‍රියාපටිපාටි සාමාන්‍ය ජන ජීවිතයට සහ එදිනෙදා ජීවනෝපායන්ට ද බාධාකාරී තත්ත්වයන් නිර්මාණය කරන බව අවධානය ලක්කරමින් ද,

එකී තත්ත්වයන් යටතේ, රටේ සංවර්ධනයට යෙදවිය හැකි මුදල්, කාලය හා ශ්‍රමය ඵලදායී උපයෝජනයක් සිදු නොවීම හා අධිනියාමනය තුළ අවිධිමත් භාවිතයන් මෙන්ම දූෂණය සඳහා ඉඩකඩ නිර්මාණය වීමේ හැකියාවක් ඇති බැවින් ද,

ජන ජීවිතය පහසු කරමින් රට සීඝ්‍ර සංවර්ධනයක් කරා රැගෙන යාමට මෙම සංකීර්ණ වූ චක්‍රලේඛ, නීති රෙගුලාසි මහජන හිතකාමී ලෙස යළි සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම් :-

1. ලලිත් වීරතුංග මැතිතුමා
   ජනාධිපති ප්‍රධාන උපදේශක
2. එස්.ඩී.ඒ.බී. බොරලැස්ස මැතිතුමා
   ලේකම්, ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
3. එම්.එම්.සී. ප්‍රදීනාන්දු මැතිතුමා
   විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්, විදුලිබල අංශය
4. ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා
   සභාපති, ජෝන් කීල්ස් සමූහය
5. සුරේෂ් ද මැල් මැතිතුමා
   සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලය
6. ජේ.සී. වැලිගමගේ මෙනවිය
   අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
7. චන්දන කුමාරසිංහ මැතිතුමා
   ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
8. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මැතිතුමා
9. ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මැතිතුමා

10. තිෂාන් සුබසිංහ මැතිතුමා
    ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී
11. රංජිත් ගුණතිලක මැතිතුමා
    ප්‍රධාන විධායක නිලධාරී, සන්කෙන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාගම
12. රේණුකා වීරකෝන් මහත්මිය
    විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
13. ජෙරාඞ් ඔන්ඩච්චි මැතිතුමා
    අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
14. අර්ජුන් ප්‍රනාන්දු මැතිතුමා
    අධ්‍යක්ෂ - විධායක නොවන, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
15. එස්.පී. ලියනආරච්චි මැතිතුමා
    සුළු හා මධ්‍ය පරිමාණ ඉදිකිරීම් අංශය
16. ඇන්ස්ලම් පෙරේරා මැතිතුමා
    කළමනාකාර අධ්‍යක්ෂ, මෙල්ස්නා තේ
17. නිශ්ශංක විජේරත්න මැතිතුමා
    මහලේකම් / ප්‍රධාන විධායක නිලධාරී, කර්මාන්ත මණ්ඩලය
18. චන්ද්‍රා වික්‍රමසිංහ මැතිතුමා
    සභාපති / අධ්‍යක්ෂ ජනරාල්, තීම් රිසෝර්ට්ස් ඇන්ඩ් ස්පාස්

මහජන හිතකාමී ලෙස පවත්නා නීති රෙගුලාසි සරල කිරීම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

01. ආයෝජන හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන් ප්‍රමුඛව අනෙකුත් සියලු ක්ෂේත්‍රයන්ට අදාළව දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස්, අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයන් සහ අනුමත කිරීමේ පටිපාටි, රාජ්‍ය මූල්‍ය හා බදු ආදායම් සම්බන්ධ සියලු නීති, රෙගුලාසි සහ ඒවා ඇති කිරීමට බලපෑ කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් පූර්ණ සමාලෝචනයට ලක් කිරීම.

02. විශාල ප්‍රමාණයක් චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම හා වරින්වර විවිධ නීති රෙගුලාසි බලාත්මක කිරීම හේතුවෙන් අධි නියාමනයක් ඇති වීම නිසා මූලික අරමුණෙන් බැහැරවීමක් සිදු වී ඇත්දැයි අධ්‍යයනය කිරීම.

03. වඩාත් ඵලදායී නව නියාමන ක්‍රමවේදයන් හඳුනා ගැනීම සඳහා ගෝලීය ප්‍රමිතීන් තුළ උක්ත නීති රෙගුලාසි වල අදාළත්වය සහ ශ්‍රී ලංකාව තුළ ඒවායේ යෝග්‍යත්වය ඇගයීමට ලක් කිරීම.

04. දැනට පවතින සංකීර්ණ හා අධිනියාමන නීති පද්ධති තුළ ඒවා බලාත්මක කිරීමට රජයටත්, ඒ සඳහා අනුගත වීමට ජනතාවටත් දැරිය යුතු වන වියදම සහ උක්ත නීති රෙගුලාසි හේතුවෙන් දූෂණයන් හා අවිධිමත් භාවිතයන් නිර්මාණය වීමට ඇති හැකියාවන් තක්සේරු කිරීම.

05. දැනට පවතින චක්‍රලේඛ උපදෙස් නීති රෙගුලාසි සරල කළ හැකි ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා එසේ සරල කිරීම හා නවීකරණය කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම.

06. ජාතික මට්ටම, පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා විවිධ අනුමත කිරීම් අවසර දීම් හා බලපත්‍ර නිකුත් කිරීම් ක්‍රියාවලි සිදු කිරීම හේතුවෙන් ක්‍රියාවලි ද්වීකරණයන් සිදුවී තිබේදැයි අධ්‍යයනය කොට එවැනි ක්‍රියාවලි සුදුසු පරිදි සංශෝධනය කිරීම.

තව ද, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ලලිත් වීරතුංග මැතිතුමා සහ ජෝන් කීල්ස් සමූහයේ සභාපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා පූර්වෝක්ත කොමිෂන් සභාවේ සම සභාපතිවරුන් ලෙස පත් කරමි.

තව ද, මෙම කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් හිටපු අමාත්‍යාංශ ලේකම් ජී.එස්. විතානගේ මහතා පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට උක්ත කොමිෂන් සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, පෙරකී කොමිෂන් සභාවේ සාමාජිකයින් වන ඔබ කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තව ද, මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරීම දින 90 ක් තුළ ඉටු කිරීමට කටයුතු කළ යුතු ය.

තව ද, මෙම කොමිෂන් සභාව වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතු යැයි ද, ලබාදිය යුතු සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තව ද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙර කී කොමිෂන් සභාව විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙර කී කොමිෂන් සභාවට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ ජනවාරි මස 07 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.